




# අනුන්ගේ ශරීර "මගේ" කරගැනීම

**"මගේ" යැයි සැළකිය හැක්කේ යමක් අපට අවශ්‍ය ආකාරයට පවත්වා ගැනීමට සහ නවත්වා ගැනීමට හැකියාවක් ඇත්නම් පමණකි.**

අප ජීවත්වන ලෝකයේ ඇති සියලු දේ 'මම', 'මගේ' සහ 'මගේ නොවන' යනුවෙන් වර්ග කොට හඳුනාගැනීමේ දෘෂ්ටියක් අප තුළ ස්වාභාවයෙන්ම පවතින බවත්, එහෙත් එම දෘෂ්ටියෙහි බලවත් වරදක් පවතින බවත් ගියවර 'විදර්ශනා' වෙන් පැහැදිලි කෙරිණ. අප වැඩියෙන්ම දුකට පත්වන්නේ ''මම'' වශයෙන් පුරුෂ පුද්ගලයෙකු ඇතැයි අප සතු දෘෂ්ටිය සහ ඒ ''මම'' කෙරෙහි අප සිත තුළ පවතින බලවත් බැඳීම (තණ්හාව) හේතුවෙන් බවද, එහෙත් එලෙස ''මම'' යැයි ගත හැකි පුරුෂ පුද්ගලයෙකු ලෝකයේ විද්‍යාමාන නොවන බවද පූජ්‍ය උඩුදුම්බර කාශ්‍යප හිමියෝ එහිදී පහදා දුන්හ. මෙවර අවධානය යොමු කෙරෙන්නේ ''මගේ'' යනුවෙන් අප බැසගෙන ඇති දෘෂ්ටිය සහ එලෙස ''මගේ'' යනුවෙන් ගත හැකි යමක් සත්‍යවශයෙන්ම ලෝකයේ තිබේද යන්න විමසා බැලීමටය. මෙල්බර්න්හි බෙරික් බෞද්ධ විහාරස්ථානයේ වාර්ෂික භාවනා පුහුණු වැඩසටහන ආරම්භ කරමින් පූජ්‍ය උඩුදුම්බර කාශ්‍යප ස්වාමින්වහන්සේ පැවැත්වූ ප්‍රථම ධර්ම දේශනාවේ ලේඛනගත දෙවන කොටසයි මේ.

තමන්ගෙන් පරිබාහිරව ලෝකයේ ඇති දේවල් අතුරින් කිසියම් ප්‍රමාණයක් තමන්ගේ (''මගේ'') බවටද සෙසු දේවල් තමන්ගේ නොවන (මගේ නොවන) බවටද වන ආකල්පයක්, පූර්ව විනිශ්චයක් අප සියලු දෙනාගේ චිත්ත සන්තානයන්හි තිබේ. ඒ මත සිටිමින් අපි තමන්ගේ යැයි කියන දේවල්වලට (''මගේ'' දේවල්වලට) අයිතිවාසිකම් කියන්නෙමු. ඒවා අපට වුවමනා ආකාරයෙන් හැසිරවීමට වෙහෙස වන්නෙමු. එසේ සිදුවන විට සතුටට පත්වන්නෙමු. එසේ නොවන විට දුකට පත්වන්නෙමු. එහෙත් තමන්ගේ නොවන සේ සලකන දේවල් පිළිබඳ නොසලකා හරින්නෙමු. එනිසාම ඒවා නිසා විශේෂයෙන් සතුටට හෝ දුකට පත්වීමක්ද නොමැති තරම්ය. එසේ වන්නේ නම් ඒද ඉතා අල්ප ස්වල්ප වශයෙනි.

'මගේ' යනුවෙන් අප දැඩිව සිතාගෙන (දෘෂ්ටියකට බැස) සිටින දේවල් පිළිබඳ අපට ඇති අයිතිය, හිමිකම පිළිබඳ විමසා බලමු.



ඔබ ඔබේ යැයි සිතා කටයුතු කරන දේවල් ලැයිස්තුවක් සකස් කරන්න. එහි මුලටම එන්නේ ඔබේ සිරුරත්, මනසත් වනවාට සැකයක් නැත. ''මගේ ඇඟ රිදෙනවා'', ''මගේ හිතට අමුත්තක් දැනුණා'' ආදී වශයෙන් ඔබ කියන්නේ එබැවිනි. අනතුරුව මගේ දෙමව්පියෝ, මගේ බිරිය, මගේ සැමියා, මගේ දරුවන්, මගේ යාලුවෝ, මගේ නෑදෑයෝ, මගේ ගෙදර, මගේ වාහනය, මගේ ඉඩම... ආදී වශයෙන් මේ ලැයිස්තුව සැළකිය යුතු තරම් දීර්ඝව පෙළගැසෙනු ඇත. මෙලෙස මගේ, මගේ, මගේ යැයි සිතා සිටිමින් ඒ අනුව කටයුතු කරන දේවල් පිළිබඳ ඔබට ඇති අයිතිය, හිමිකම කවරාකාරද? එහි ප්‍රමාණය කුමක්ද? විමසා බලමු.

සින්නක්කර ඔප්පුවකින් තමන්ගේ නමට නිවෙසක් ඇති අයෙකුගේ ආකල්පය එය තමන්ගේ නිවෙස බවය. ඔබ එවැනි හිමිකාරිත්වයක් සහිත නිවෙසක ජීවත්වන්නේ නම් ඔබ එයට ''මගේ නිවෙස'' යැයි කියයි. ''මගේ නිවෙස'' යන ආකල්පයෙන් කටයුතු කරයි. හෙවත් ''මගේ නිවෙස'' යන දැඩි දෘෂ්ටියට බැසගෙන සිටී. ලෝක සම්මතයද එයම වේ. එනම් සෙසු ලෝකයාද එය ඔබේ නිවෙස ලෙස පිළිගනී. එකී හිමිකම පවතින බැවින් අවශ්‍ය නම් ඒ නිවෙස කඩා දමන්නට ඔබට හැකිය. අවශ්‍ය නම් ඒ නිවෙසට අමතර කෑල්ලක් එක් කිරීමට ඔබට හැකිය. එමෙන්ම ඒ නිවෙස වෙනත් අයෙකුට විකිණීමට හෝ පැවරීමටද ඔබට හැකිය.

එහෙත් කුළී නිවෙසක ජීවත්වන අයෙකුට එසේ කළ නොහැකිය. තමන් ජීවත්වන නිවෙස පිළිබඳ ''මගේ'' යන ආකල්පයක් නිවැසියාට කිසිදු ආකාරයකින් ඇති වන්නේද නැත. බලෙන් හෝ එවැනි අදහසක් ඇතිකරගැනීමද කිසිසේත්ම කළ නොහැකිය. හේතුව තමන්ට ඇත්තේ එහි තාවකාලික හිමිකමක් බව හෙතෙම හොඳින්ම දන්නා බැවිනි. ඒ නිවෙස කඩා බිඳ දමන්නට නිවැසියාට හැකියාවක් නොමැත. නිවෙසට අමතර කොටස් එක් කිරීමට නොහැකිය. වෙනත් අයෙකුට විකිණීමට හෝ පැවරීමට නොහැකිය.

කුළී නිවැසියෙක් එය තමන්ට හිමිකමක් නැති නිවෙසක් බව දැනගෙන කටයුතු කළද ඒ නිවෙසේම ඇති දැඩි වන කුඩා දරුවෙකු එය තමන්ගේ නිවෙස යැයි සිතා සිටිය හැකිය. හේතුව, කිසියම් දිනෙක වැඩිහිටියෝ තේරුම් කර දෙන තෙක් ඒ දරුවා තමන් ජීවත්වන්නේ කුළී නිවෙසක බව නොදන්නා බැවිනි. මෙලෙස එකම නිවෙසක ජීවත්වන කෙනෙකුගේ සිත තුළ එම නිවෙස ''මගේ'' ය යන සිතිවිල්ලක් ඇතිවන්නේද, එම නිවෙසේම ජීවත්වන තවත් කෙනෙකුගේ සිත තුළ එය ''මගේ'' යන සිතිවිල්ලක් ඇතිනොවන්නේද නොදන්නාකම සහ දන්නාකම නිසාය. ''මගේ'' නොවන දෙයක් පිළිබඳව ''මගේ'' යන අදහසක් කුඩා දරුවාට ඇතිවන්නේ අන් කිසිවක් නිසා නොව ''නොදන්නාකම'' නිසාය. නොදැනීම හේතුකොටගෙන ''මගේ'' නොවන දෙයක් පිළිබඳව ''මගේ''ය යන අදහසක් සිත තුළ ඇතිවුවද ඒ හේතුවෙන් එය කිසිදාක ''මගේ'' නොවන බව අප විසින් අවබෝධ කරගත යුතුය.

පුද්ගලයෙකුට කුළී නිවෙස ''මගේ'' නිවෙස යැයි නොසිතෙන්නේ ඇයි ? එහි පූර්ණ හෙවත් පරම අයිතිය අනුන් සතු බැවිනි. තමන් සතු නොවන බැවිනි. සහ ඒ බව කුළී නිවැසියා හොඳින්ම දන්නා බැවිනි. කුළී නිවැසියෙකුට නිවෙස තුළ කැමැති ආකාරයකට ජීවත්විය හැකිය. කැමති නම් නිවෙස තුළ සිටිය හැකිය. කැමැති නම් නිවෙසින් පිටත සිටිය හැකිය. කැමති අයුරින් දොර ජනෙල් විවර කොට හෝ වසා තැබිය හැකිය. කැමති කැමති තැන්වල කැමති කැමති බඩු භාණ්ඩ තැන්පත් කළ හැකිය. එහෙත් නිවෙසේ



ශ්‍රීලාල් සෙනෙවිරත්න

හැඩය වෙනස් කිරීමට නිවැසියාට නොහැකිය. කෑල්ලක් කඩා අලුත් කෑල්ලක් එකතු කරන්නට නිවැසියාට නොහැකිය. වෙනත් අයෙකුට පවරන්නට හෝ විකුණන්නට නොහැකිය. කුළී නිවෙසක් පිළිබඳ ''මගේ'' යන අදහස ඇතිනොවන්නේ ඒ නිවෙස පිළිබඳ තමන්ට ඇත්තේ තාවකාලික සහ සීමිත අයිතියක් බවත් පරම අයිතිය වෙනත් අයෙකු සතු බවත් නිවැසියා හොඳින්ම දන්නා නිසාය. කුළියට සිටිනතාක් කුළී නිවෙස කවරදාකවත් නිවැසියාගේ වන්නේ නැත. මේ නිදසුන සිත තබාගෙන දැන් ඔබ ඔබේ යැයි දැඩිව ගෙන සිටින ඔබේ කය සහ සිත පිළිබඳ විමසා බලන්න.

ඔබ කණ්ණාඩිය ඉදිරිපිටට ගොස් මුහුණ බලන විට බොහෝවිට ඔබට ඔබේ මුහුණ පිළිබඳ ඇතිවන හැඟීම කවරාකාරද ? 'ඉතාම හොඳයි-කදිමයි' යන හැඟීමක් ඇතිවන්නේද? නොඑසේව මුහුණ තව ටිකක් පැහැපත් වූයේ නම් මැනවැයි සිතිණිද? රවුම් වූවානම් මැනවැයි සිතුණිද? තිබෙන මුහුණ හොඳ මදි බවත් ඊට වෙනස්